මගේ අංකය / எனது இல. / My No.: RG/MBD/ 11 - චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல. / Your No.:

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos.: 2889488, 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No.: 2889491
ඊ මේල් / மின்னஞ்சல் / E-mail: info@rgd.gov.lk, rg@rgd.gov.lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No.: 565

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

චක්‍රලේඛ අංක: 05/2019

දිනය / திகதி / Date: 2019.02. 26

සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,
සියලුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්

## විවාහ ලේඛනයේ 4 තීරයේ "ජාතිය" සටහන් කිරීම

උපතින් ශ්‍රී ලාංකිකයින් වන නමුත් පසුකාලීනව විදෙස් රටවල ජාතිකත්වය / පුරවැසිභාවය ලබා ඇති පුද්ගලයින් විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ විවාහ වීමට අදහස් කර ඇති විට, විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව විවාහයක් ලියාපදිංචි කරනු ලබන විවාහ ලේඛනයේ (ලියාපදිංචි කිරීම් ආ 115 ආකෘතිය) 4 වන තීරයේ පාර්ශවකරුවන්ගේ "තරාතිරම නොහොත් රක්ෂාව සහ ජාතිය" සඳහන් කළ යුත්තේ කෙසේද යන්න සම්බන්ධයෙන් නිතිපති උපදෙස් විමසන ලදී.

ඒ අනුව උපතින් ශ්‍රී ලාංකිකයින් වන නමුත් පසු කාලීනව විදෙස් රටවල ජාතිකත්වය / පුරවැසිභාවය ලබා ඇති පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතිය සටහන් කිරීමේ දී වර්තමාන ජාතිකත්වය / පුරවැසිභාවයට (විදෙස් ගුවන් ගමන් බලපත්‍රය අනුව ජාතිකත්වය -Nationality) අමතරව එම පුද්ගලයාගේ උප්පැන්න සහතිකයට අනුව සඳහන් ජාතිය (Race) වරහන් තුළ ඇතුළත් කිරීම සුදුසු බව නීතිපති මතය වන බැවින් එවැනි ඉල්ලීම් ඉදිරිපත් වන අවස්ථාවන්හි දී එසේ කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.
උදා. බ්‍රිතාන්‍ය ජාතික (ලංකා දෙමළ)

මෙම චක්‍රලේඛය ලද බව දන්වන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් - 1. නීතිපති - E 60 / 2018 යොමුව අනුව දැනගැනීම සඳහා

2. ලේකම් - අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - ඔබගේ දැන ගැනීම සඳහා

3. කොමසාරිස්, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව - ඔබගේ දැන ගැනීම සඳහා

4. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - ඔබගේ දැන ගැනීම සඳහා

5. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - ඔබගේ දැන ගැනීම සඳහා සහ අවශ්‍ය කටයුතු සඳහා

6. සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් - ඔබගේ දැන ගැනීම සඳහා